## විවිධ නැටුම් වර්ග

# ගැමි නැටුම්

ලෝකයේ සෑම රටකටම පොදු වූ ගැමි නැටුම් නැතහොත් ජන නැටුම් සම්ප්‍රධායක් ඇත. එකී සෑම නර්තනයක්ම තම රටට අදාළ ජාතිකත්වය පිළිබිඹු කරනඅනන්‍යතා ලක්ෂණාවලින් යුක්ත වුවද මූලික ආකෘතිය අතින් පොදු සමානත්වයක් දක්නට ඇත.

- සාමුහික සහාගීත්වය සරල අංග චලනවලින් යුක්ත බව
- ජීවන රටාව සහ සමාජ සම්බන්ධතා නිරූපණාය වීම.
- විනෝදස්වාදය අරමුණු කොට ගැනීම.
- ජීවන රටාව සහ සමාජ සම්බන්ධතා නිරූපණාය වීම.

ශ්‍රී ලංකාව කුඩා රටක් වුවත් අපේ රටට ආවේණික වූ අනන්‍යතා ලක්ෂණ පෙන්නුම් කරනු ලබන ගැමි නැටුම් රාශියක් ඇත.එසේ හෙයින් අන් කිසිදු රටකට දෙවනි නොවන තරමට සංස්කෘතික පොහොසත්කමක් අප සතුව ඇත.යක් ඇත.එසේ හෙයින් අන් කිසිදු රටකට දෙවනි නොවන තරමට සංස්කෘතික පොහොසත්කමක් අප සතුව ඇත.

දේශීය ගැමි නැටුම් ප්‍රභවය ලබා ඇත්තේ එකම මුලාශ්‍රයක් පදනම් කොටගෙන නොවේ. එසේ හෙයින් එක් එක් ගැමි නැටුම සඳහා එයටම ආවේණික වූ සංස්කෘතික පසුබිමක්ද පවතී.

පොදුවේ ගත් කල ධීවර නැටුම ,ගොයම් කැපීම,ගොවි නැටුම, කුලු නැටුම, තේ දලු නෙළීම,පන් නෙළීම වැනි නර්තනාංග කවර ආකාරයකින් හෝ ජීවන වෘත්තින් සමග සම්බන්ධතාවයක් ප්‍රදර්ශනය කරයි.

චාමර,සවරන් පතුරු වැනි ගැමි නැටුම් සමාජ අවශ්‍යතා සමඟ බැඳී පවතින නර්තනාංගයන්ය. ගෘහස්ථව සිදු කරනු ලබන සිදුකරනු ලබන විවිධ කාර්යයන් අදාළ නිර්මාණය වූ කළගෙඩි නැටුම ,මෝලගස් නැටුම,අනෙක් ගැමි නැටම්වලින් වෙනස්ව පෙනේ. එසේ වන්නේ එකී ගැමි නැටුම්වල යම් තරමක් දුරට ප්‍රකාශනාත්මක ලක්ෂණයන්ද අන්තර්ගත වන බැවිනි.

ලී කෙළි නැටුම,කඩු සරඹ නැටුම වැනි ජන නැටුම් පරණි යුද සරඹ ආශ්‍රිතව නිර්මාණය වූ නර්තනයන්ය. ඇදහිලි හා විශ්වාස පදනම් කොටගෙන නිර්මානය වූ ගැමි නැටුම්ද දේශීය ජන නැටුම් අතරේ දක්නට ඇත. "කවාඩි නැටුම" ඒ සඳහා කදිම උදාහරණයකි.

ඇතැම් ගැමි නැටුම් සඳහා දේශීය ශාන්ති කර්මයන්ගේ ආභාෂය ලැබී ඇති බව ඇතැම් විචාරයකන්ගේ අදහසයි. එකී මතයන්ට අනුව කුලු,චාමර,තාලම් වැනි ගැමි නැටුම්  බිහිවීමට ශාන්ති කර්ම හා එහි අන්තර්ගත ඇතැම් නර්තන කොටස් බලපා ඇතියි සැලකේ. රට යකුන් යාගයේ එන"කුල්ලේ පිදේනිය" ඇසුරෙන් කුලු නැටුමත් ,දෙළහ පෙළපාලියේ එන චාමර සැලීමේ අවස්ථාව ඇසුරෙන් චාමර නැටමත්,සුනියම් යාගයේ වඩිග පටුන නැටුම ආශ්රෙරයන් "තාලම්" නැටුමත් ප5භවය ලැබූ බව එකී මත දරන්නවුන් ප්රසකාශ කරති.කෙසේ වෙතත් දේශීය ගැමි නැටුම් එකම මුලාශ්ර"යක් පදනම් කොට බිහිනොවූ බව ඉහත කී තොරතුරු අනුව පැහැදිළි වේ.

# කුලු නැටුම

දේශීය ගැමි නැටුම් අතරින් වඩාත් ජනප්‍රිය නර්තනයක් ලෙස සලකන කුලු නැටුම,එක අතකින් ජීවන වෘත්ින්ටත්,තවත් අතකින් ගෘහස්ථ ක්‍රියාකාරකම්වලටත් සම්බන්ධ වී නිර්මාණය වුවකි.මෙහි ප්‍රභවය නැතහොත් ආරම්භය සිදුවුයේ"ශාන්ති කර්ම"නර්තනය හේතුකොට ගෙන යැයි ඇතැමුන් සලකති.

කෙසේ වෙතත් වී ගොවිතැන හා සම්බන්ධ කටයුතුවලදී ප්රංයෝජනයට ගන්නා විවිධ උපකරණ අතරින් කුල්ල ද එකකි. කමත් බස් වහරට අනුව එය හඳුනවන්නේ "යතුර" නමැති පාරාභාෂික පදයෙනි. අස්වැන්න කපා ගැනීමෙන් පසු "බැත" හෙවත් වී අස්වැන්න පිරිසිදු කර ගැනීම සඳහා කරනු ලබන කටයුතු වලදී "කුල්ල" අත්යයවශ්යන භාණ්ඩයක් ලෙස යොද ගනු ලැබේ."බැත" ගොඩ ගැසීම නැතහොත් පා ගත් අස්වැන්න කමත් කණුව මුල ගොඩකර කාටුව පිස හැරීම සඳහා භාවිත කරන්නේ කුල්ලයි. බැත ගොඩ මතට සුළං පහර වදින සේ කුල්ල දෙපසට වැනීම කාටුව හෙවත් අපද්රේව්‍ය. ඉවත් කිරීම සඳහා ගොවීන් යොදගන්නා සරල ක්රටමයකි.

වටත් සදිසි බටකොළ වියපු වල්ලියේ
මටත් බලන්නට සව්දම් ගැසිල්ලියේ
මෙරට ළඳුන් කුලු සරඹෙට ලවුල්ලියේ
පැරකුම් රජුගේ දුව නවරත්න වල්ලියේ



# කඩු සරඹ නැටුම

ශ්‍රී ලංකාවේ ප්‍රකට ජන නැටුම් අතරින් සුවිශේෂි ලක්ෂණ කිහිපයක් පිළිඹිඹු කරන නර්තනයක් කඩුසරඹ නැටුම හැඳින්විය හැකිය.

මෙම නැටුම ,

- සෘජුලෙස ජීවන වෘත්තීන් හා සම්බන්ධතාවයක් දක්නට නැත
- පුරාණ යුද නැටුම් නැතහොත් යුද සරඹ අභ්‍යාදස ඇසුරැ කොට ගෙන බිහිවී ඇත.
- රංගනයේ යෙදෙන්නා දෑතෙහි උපකරණ යුගලක් දරා සිටි. (කඩුව හා පළිහ)
- සාම්ප්‍රයදායිකව පැවත එන පද කොටස් අන්තර්ගතය
- වේගවත් ලය මානයකින් යුක්තය.

බොහෝ ජන නැටුම් ජීවන වෘත්තින් හෝ ගෘහස්ථ කාර්යයන් තේමා කොට ගෙන නිර්මාණය වුවද කඩු සරඹ නැටුම එවැනි ලක්ෂණයක් පිළිඹිඹු නොකරයි. මෙය පැරණි යුද සරඹ අභ්‍යාස ආශ්‍රිතව නිර්මාණය වූ නර්තනයක් ලෙස පෙනී යන්නේ සතුරුමිතුරු දෙපිරිසක් හා කෙරෙන සටනක ස්වරූපයෙන් මෙම නර්තනය තුළින් නිරූපනය වන හෙයිනි.

ඇතැම් විට ලී කෙළි නැටුම මෙන්ම මෙකී නර්තනයන් ක්‍රීඩා අංගයක් වශයෙන් පවතින්නට ඇතැයි අනුමාන කළ හැකිය. දෙපිරිසක් අතර කෙරෙන තරගයක ලක්ෂණයක් මෙයින් නිරූපණය වීම මෙම අනුමාන සාධකයකි. එක් පිරිසක් පහර දීමත්, අනෙක් පිරිස පහරින් ගැලවෙන ආකාරයත් මෙම නර්තනයෙහි මූලික ආකෘතිය වී ඇත. එක් එක් අතට කෙරෙන පෑහිම් කැරකීම් වැනි චලන මෙහිදී බහුලව යොදගෙන ඇති හෙයින් කඩු හරඹ නැටුම අනෙක් ගැමි නැටුම්වලට වඩා විශේෂත්වයක් දරයි.

ගෙන රන් කෝවේ ලා උණු කර
මීන
සොඳ පදමට වක්කර ගන කර
ගෙන
හැඩකර තලයද මීට ලියවා
ගෙන
සැදුවයි කඩුවක් මීට ලියවා
ගෙන

මකර රුවින් මීට යොදනා
කැටයම්

අතට උඩින් නයි පෙනයක
අන්දම්
තලය දිගින් ලියවැල් සොඳ
මල්කම්
කඩුව මුනින් අල්ලන
මාලක්කම්

# ගොයම් නැටුම

කෘෂිකාර්මික ජීවන රටාවකට හුරුපුරුදු වූ පැරණි ගැමි සමාජයක ගොයම් කෙත් හා හේන් ගොවිපල කමත් ජීවිතය හා බැඳුණු වෙනත් ස්ථානයන් නොවේ. අව්වැසි නොතකා දුක්ගැහැට විඳිමින් කාර්යයෙහි නිරත වුවද එම සියලු පීඩා ඉවතලමින් ගීයක් ගයමින් බුම්මැඩියක් හෝ යක්බෙරය වයන තාලයේ රිද්මයට අනුකූලව ඔවුන් එම කාර්යෙහි නිරත වී ඇත. අද වුවද උඩරට පළාත්වල හා වන්නි පළාත්වල ගැමි ජනයා මෙවන් ආශ්වදනීය ක්‍රියාවන් අනුගමනය කරනු දක්නට ලැබේ. ගොයම් කාපීමෙදී දැකැත්ත භාවිතා වන ස්වරූපය කිසියම් රිද්මකයට මූර්තිමත් කිරීම ගොයම් නැටුම තුලින් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම රඟ දක්වන මෙකී නැටුමේදී කරහම් නම් උඩැක්කියට සමාන වාද්‍ය භාණ්ඩය සාමුප්‍රධායික වාද්‍ය භාණ්ඩයක් සේ උපයෝගි කර ගැනේ.

ද්‍රවිඩ ජාතින් අතර භාවිතා වන තවත් නර්තන අංගයක් ලෙස තාලම් නැටුම්ද හැඳින්විය හැක. කාන්තාවක් පමණක් සහභාගිවන මෙකී නර්තනය ශ්‍රී ලංකාවේ සිංහල ජාතින්ගේ තාලම් අතර මෙන්ම ඉන්දියාවේද මෙම නැටුම් භාවිතා වන අතර විශේෂ ගායනදෙ ඉදිරිපත් කෙරේ.

මල්බෝල නැටුම යනු ද්‍රවිඩ ගැමි නැටුම් හි තවත් අංගයකි. මෙය පන්දු නැටුම නමින්ද හැඳින්වූ අතර මල්වලින් සකසාගත් බෝල ඇතිව නර්තනය කෙරේ.ස්ත්‍රීන් සඳහා විශේෂ වූ මෙකී නර්තනයේ ගායනය යොද ගන්නා බව සැළකිය යුතුය.

උඩරට පළාත් ද්‍රවිඩ ජනයාට විශේෂිත ව තවත් නර්තන විශේෂයක් ගබව හඳුන්වා දුන් කොනදු පරිතාල් හෙවත් තේ දළු නැටුම්ද මේ හා සමකාලීනව විකාශනය වූවා යැයි සිතිය හැක. සිංහල හා ද්‍රවිඩ සම්ප්‍රධායන් දෙකෙහිම නර්තන විලාශයන් බොහෝ දුරට එක හා සමාන වීමත් කාන්තාවන්ට පමණක් විශේෂ වීමත් මෙහි පොදු ලක්ෂණයක් බව අමතක නොකළ යුතුය.

